**ඒ භාග්‍යවත් වූ අර්හත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට නමස්කාර වේවා !!!**

# සංඝාවාස පූජා මහා පුණ්‍ය කර්මය
# ගජබා ආශ්‍රමය, අනුරාධපුරය

**සියලු සත්වයන්ට උත්තම වූ ධර්මයට ඊශ්වර වූ ධර්මරාජ වූ ධර්මස්වාමී වූ තථාගත වූ සර්වඥ වූ සම්මා සම්බුදුනට නමස්කාර කරමි !!!**

බෞද්ධයාගේ මහත් වන්දනාවට පාත්‍ර වූ අනුරාධපුර පුද බිමට නුදුරින් පිහිටි අභය වැව ගජබා ආශ්‍රම භූමියේ ආවාසයක් තැනීමේ කටයුතු මේ දින වල සිදු වෙමින් පවතී. ඓතිහාසික අනුරාධපුර පුද බිම වන්දනා කරන අටියෙන් සිව් දිගින් වඩින මහා සංඝයාගේ වැඩ වාසය කිරීම උදෙසා මෙය නිම වේ. දැනටද දිද්දෙණිය, පොල්ගස්දූව, ඇද්දලගල, වෑදුව, ලබුනෝරුව, නා උයන වැනි ආරණ්‍ය වලින් සංඝයා වහන්සේ මෙම ආශ්‍රම භූමියේ ඉතා අවම පහසුකම් මධ්‍යයේ නවාතැන් ගනිති.

මහා සංඝයාට ආරක්ෂාව සැපයීම මහා කුසලයකි. මහා සංඝයාට ආරක්ෂාව හා පහසුකම් සැලසීම අනන්ත කාලයක් සුගතියේ සැප ලැබීමට හේතු වන මහත් ඵල වූ පිංකමකි.

දක්ඛිණ විභංග සූත්‍රයේදී භාග්‍යවතුන් වහන්සේ වදාළේ, සම්මා සම්බුදුන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයාට දන් දීමට වඩා ශීල, සමාධි, ප්‍රඥා වඩන සිව් දිග්හි භික්ෂූන් වහන්සේලා උදෙසා ආරාමයක් තනා පූජා කිරීම තුලින් මහත් කුසල් සිද්ධ වන බවය. ආරාම පූජාවේ අනුසස් පිළිබඳ ත්‍රිපිටක ග්‍රන්ථ වල සඳහන් වන අවස්ථාවන් කිහිපයක් මෙසේය.

“සංඝයාට පහසුකම් සැලසීම හේතුවෙන් මරණය හමුවේ මරණයෙන් අත් මිදුනේය, අනාරක්ෂිත අවස්ථා වල ආරක්ෂාව ලැබුවේය. දුක හමුවේ සැප ලද්දේය. කිසිවෙකු විසින් මැඩලිය නොහැක්කේ විය” (සෝෂක කථා පුවත). “ආවාස දුන්නේ සියල්ල දුන්නා වේ”.

දාසයෙක් ලී කැබලි හයක් හා තෘණ උපයෝගී කොට කුටියක් කර පූජා කළේය. ඒ කල්ප 91 කට පෙරය. ඒ කුසලයෙන්;

1. තව්තිසා දෙව්ලොව දෙව් විමනක් පහල විය.
2. උපනුපන් තැන තම සිතේ හැටියට ප්‍රාසාද පහළ විය.
3. බිය, තැති ගැනීම්, ලොමු දැහැ ගැනීම් නැත්තෙක් විය.
4. සිංහ, ව්‍යාඝ්‍ර, වලස්, වෘක, කරබානා වලස් ආදී සතුන් තමා යන විට පාරෙන් ඉවත් විය.
5. සර්පයන්, භූතයන්, නාගයන්, කුම්භාණ්ඩයන්, රකුසන් තමා යන විට මාර්ගය ඉඩ දුන්නේය. හිරිහැර නොලද්දේය. (තිණකුටිදායක ථේර පුවත)

බට ලී වලින් හා තෘණ වලින් කුටියක් සාදා පූජා කළේය. කල්ප දාහතරක් දෙව් සැප විඳින්නට එය හේතු විය. 74 වතාවක් සක්විති රජවිය. අවසන් අත් බැව්හි සිව් පිළිසිඹියා පත්ව රහත් වීමට ඒ පින හේතු විය. (නළාගාරික ථේර පුවත)

මේ ආවාසය ඉදිකොට සංඝයා වහන්සේලාට පූජා කිරීමට අපේක්ෂා කරමු. සියලු වැඩ නිම වූ පසු ලක්දිව නන් දෙස වැඩ වාසය කරන්නා වූ භික්ෂූන් හට මෙහි නවාතැන් පහසුකම් ඇති බව සැල කරමින් හසුන්පත් යවන්නෙමු.

## මේ දිවියේද, මතු සසරෙහිද, සුව කැමති ඔබ මේ කුසල කර්මයට සහභාගී වෙත්වා!

**සියලු සත්වයනට තෛකාලික වූ සියලු දුකින් මිදී ලබන්නා වූ අජර වූ අමර වූ අමා මහ නිවන අවබෝධ වීම පිණිස මෙම මහඟු පුණ්‍ය කර්මය උපනිශය වේවා!**

**තෙරුවන් සරණයි!**

ශාසනාභිවෘද්ධිකාමී,

හකුරුවෙල චන්ද්‍රාලෝක හිමි (+94 777070926)

ගජබා ආශ්‍රමය

අභය වැව පෙදෙස

අනුරාධපුර

ඔබගේ ආධාර පහත සඳහන් ගිණුමට බැර කල හැක:

**සිහල සවිය සමිතිය,**

**සම්පත් බැංකුව (අනුරාධපුර ශාඛාව)**

**ගිණුම් අංකය - 1021 6099 7714**

පහතින් දැක්වෙනුයේ ආවාස ගෙය ඉදිවන නොයෙකුත් අවස්ථා දැක්වෙන ඡායාරූප කිහිපයකි.



















